
# 09
# යෝග්‍යතා පිවිසුම




විවිධ අවස්ථාවන්හි පාවුල් තුමා සේවය කරන විට ඒ ඒ අවස්ථාවලට සරිලන ලෙස වචන, අන්තර්ගතය, ක්‍රමවේදය වෙනස් කළ බව පෙනේ. තුන් වන ධර්මදූත ගමනෙහි විශේෂ කොටසක් මේ යටතේ සලකා බැලේ. මෙහි විශේෂත්වයක් වන්නේ හරි දැක්ම තුළින් කිතුනු සේවය යි. මෙහි දී තිමෝති, ත්‍රොපිමස්, ලූක්, පාවුල් සමඟ තවත් අය ගමනේ යෙදුනි. ඔවුන් ක්‍රි. ව. 53 ፡ 57 අතර පමණ කාලය තුළ කිලෝමීටර 4024 ගමන් ගත් බව පෙනේ.

## තුන් වන ධර්ම දූත චාරිකාව



❖ පාවුල්ගේ තුන් වන ධර්ම දූත ගමන ( ක්‍රියා 18 : 23 - 21 : 19 )



## එපිසය ( ක්‍රියා 19 පරිච්ඡේදය )

සුළු ආසියාවේ වැදගත් මුහුදු කොටසකි. සුළු ආසියාවේ අගනුවර ය. මෙහි අර්තේමිස් (ඩයනා) ගේ ප්‍රසිද්ධ දේවාලයක් තිබිණි. එය ලොව පුදුම හතෙන් එකක් ලෙස කලක දී සැලකිණි.

එපීසයේ ක්‍රියා කලාපය අනුව නිවැරදි දැක්ම තුළ යෝග්‍ය ප්‍රතිචාර දැක් වූ බව පෙනේ. බයිබලය හොඳින් කියවා පහත වගුව පුරවන්න.

| බයිබල් පාඨය | ස්ථානය | සිදුවීම | වචන | ක්‍රියා | ක්‍රමවේදය | උගත් හැකි පාඩම |
|---|---|---|---|---|---|---|
| ක්‍රියා 19 : 1 10 | එපීසය | ස්නාවක ජොහන්ගේ ගෝලයන් හමුවීම | ඔබ අදහා ගත් කළ ශුද්ධාත්මයන් ලැබුවා ද?<br><br>ඔවුන් ශුද්ධාත්මය ඇති බවක් නොදනිති යි පැවසීම<br><br>එසේ නම් කුමන බව්තීස්මයක් ලැබුවේ ද?<br><br>යොහාන්ගේ බව්තීස්මය.<br><br>ජෙසුස්වහන්සේ කෙරෙහි අදහා ගන්න. | ස්වාමීන් වන ජේසුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්මය කිරීම. | ස්නාවක ජොහන් ගේ බව්තීස්මය ලැබූ බව අසා ජෙසුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්මය කිරීම | නිවැරදි මාර්ගය දැක එය සඳහා යෝග්‍ය ලෙස ක්‍රියාත්මක වීම. |
| ක්‍රියා 19 :1122 | එපීසය | ස්කේවාගේ පුත්‍රයෝ පාවුල් ප්‍රකාශ කරන ජේසුස් වහන්සේ ගේ | ජේසුස් වහන්සේ ද අඳුනමි. පාවුල් ද අඳුනමි. ඔබ කවුද? | යේසුස් වහන්සේ අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීමට සැරසීම. | ඔවුන් තුළින් ම විරුද්ධත්වය බිහි වීමට ඉඩ සලසා නිහඬ වීම. | වැරදි දේ ප්‍රකාශ කරමින් එය නිරුවත් කොට විනාශ කිරීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියා 19:2341 | එපිසය | නාමයෙන් යකුන් දුරු කිරීමට උත්සාහ ගැනීම.<br><br>එපිසයෙහි අර්තේමිස් ගේ රිදී රූප සාදන්නන් ගේ ආර්ථිකය බිඳ වැටීම.<br><br>අර්තේමිස්ගේ අභිමානයට පහර ගැසූ බව පවසමින් කලබල ඇති කිරීම.<br><br>එපීසයේ කෝලහලය<br><br>සෙනඟ හරි දේ නොදැන කලබල කිරීම. | | | | | |

එකම නගරයක වුව ද විවිධ ආකාරයේ අභියෝගවලට පාවුල් හා බාර්ණබස්ට මුහුණ දීමට සිදු විය. විටෙක ඒ පිළිබඳ ව ප්‍රතිචාර දක්වමින් ද විටෙක දෙවියන්වහන්සේට ක්‍රියාත්මක වීම සඳහා නිහඬ වෙමින් ද ඒ ඒ ගැටළුවලට යෝග්‍ය ලෙස ඔවුහු ප්‍රතිචාර දැක්වූහ.

සමහර අවස්ථාවල දී ඔවුන්ගේ සාර්ථකත්වය ඒ මොහොතේ ම දැකගත හැකි විය. සමහර අවස්ථාවල දී ප්‍රතිඵල දැකීමට කල් ගත විය. සමහර ප්‍රතිචාර අභ්‍යන්තර ව සිදු විය. එය බාහිර ව දිස් නොවීය.

මේ කෙසේ ක්‍රියාත්මක වුවත් වැදගත් වූයේ ඔවුන් ගැටළුවල දී යෝග්‍ය ලෙස හැසිරෙමින් ගැලපෙන ලෙස කටයුතු කළ බව යි.

❖ **ඇගැයීම** :-

පාවුල්ගේ ජීවිතය පදනම් කර ගනිමින්

- ස්කොවාගේ පුත්‍රයන්ගේ සිද්ධිය තත්කාලීන සමාජයට අදාළ ය.
- වර්තමාන සංදර්භය තුළ කිතුනු මෙහෙවර නිවැරදි දැක්මකින් හා ක්‍රමවේදයකින් සිදුවිය යුතු ය.
- හාස්කම් සිදුකරනු ලැබුවේ දෙවිඳුන්ගේ රාජ්‍යය මතුකර ලීම මිස පෞද්ගලික සංසිද්ධියක් සඳහා නොවේ.

යන මාතෘකා යටතේ කණ්ඩායම් තුනකට බෙදී එක් කණ්ඩායමකට එක් මාතෘකාව බැගින් ගෙන කථික තරගයක් පවත්වන්න.